**ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 18 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව වෙනත් ලැබීම්වල වටිනාකම රු.547,787,346 ක් වුවද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 21)අනුව එම වටිනාකම රු.533,011,912 ක් වූ බැවින් රු.14,775,434 ක වෙනසක් පැවතුණි. | 263 වැය ශීර්ෂයට අමතරව රේඛීය අමාත්‍යාංශ අත්තිකාරම් ලැබීම් සහ තැන්පතුවක් ලෙස නොගන්නා මෝටර් රථ ආදායම්ද ආදායම් නොවන ලැබීම් ලෙස ගිණුම්ගත කර ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරීම සඳහා 263 වැය ශීර්ෂයට අදාල ලැබීම් පමණක් පාදක කරගත යුතු වේ. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**දේපල පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් දේපල, පිරියත හා උපකරණවල වටිනාකම රු.5,356,237,188 ක් වූ අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එම වටිනාකම රු.5,145,977,819 ක් වීම හේතුවෙන් රු.210,259,369 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට 2021 මූල්‍ය ප්‍රකාශන වලට අදාල ගැලපීම් සිදුකරනු ලැබේ. | වෙනස නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ අත්තිකාරම් ගෙවීම් රු.20,633,616 ක් අඩුවෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ තැන්පතු ගෙවීම් රු.20,633,616 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | මෙය අත්වැරදීමකින් සිදුවූ වරදකි. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රතිපාදන ඉතිරිවීම් | | |
| වැය විෂයයන් 05 ක වාර්ෂික ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 32 දක්වා වූ පරාසයක ඉතිරි වීම් නිරීක්ෂණය විය. | ගොඩනැගිලි නඩත්තු කටයුතු අවම වීම, නිලධාරීන් මාරුවීම, වෙළඳ පොලේ පවතින භාණ්ඩ හිඟය, ඇතිකරගත් ගිවිසුම් අවලංගු කිරීම සහ පුහුණු වැඩසටහන් නොපැවැත්වීම නිසා ඉතිරි වීම් සිදු වී ඇත. | අවශ්‍යතාවය සලකා බලා කාර්යයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන පමණක් සලසා ගත යුතු වීම. |
| (ආ) ප්‍රතිපාදන උපයෝජනය | | |
| (i) වැය විෂයයන් 02 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොතිබුණු බැවින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදලින් සියයට 05 සිට 08 දක්වා පරාසයක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකරගෙන තිබුණි. | අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් කොරෝනා වසංගතය නිසා අමතර නිවාඩු දින වැටුප් ගෙවීමත්, නව කාර්යාල ගොඩනැගිලි ලබාදීම නිසා පවිත්‍රතා කටයුතු හා ආරක්ෂක සේවා සඳහා නිලධාරීන් සංඛ්‍යාව වැඩිකිරීමත්, කාලීනව මිලගණන් වැඩිවීමත් හේතු වී තිබුණි. | ඉදිරි මුදල් වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කළ යුතු වීම. |
| (ii) ප්‍රතිපාදන ඉතිරිවීම් නිසා වැය විෂයයන් 06 ක වාර්ෂික ප්‍රතිපාදනයෙන් සියයට 1 සිට සියයට 34 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | කොවිඩ් වසංගතය නිසා වියදම් අඩුවීම සහ දේපල ණය ලබා නොගැනීම යන කරුණු හේතු වී ඇත. | අවශ්‍යතා සලකා බලා වැය විෂයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගත යුතු වීම. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක III යටතේ බැදීම් හා බැරකම් දක්වා නොතිබුණද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA – 92) අනුව රු.189,008ක බැදීම් හා බැරකම් සඳහන් කර තිබුණි. | මෙම වටිනාකම නාමික අගයක් පමණක් බවත්, තවදුරටත් ගෙවීමට ඇති අයිතමයක් නොවේ. | නිවැරදිව ගිණුම් වාර්තා පවත්වා ගත යුතු වීම. |
| (ආ) | බැරකම් ලේඛනයේ තිබුණු වටිනාකම රු.211,316 ක් වූ බැරකම් 04 ක්, බැරකම් පිළිබඳ ප්‍රකාශය- (i) හි සටහන් (iv) යටතේ ඉදිරිපත් කර නොතිබුණි. | බැරකම් අයිතම 04 මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබඳ ප්‍රකාශය (1) සටහන් iv න් ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.3,809,302,656 ක ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.3,794,864,946 ක් උපයෝජනය කර තිබුණු අතර, රු.14,437,710 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙමඉතිරිය සිදුවී ඇත. | ලබාදුන් සියළු ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 07 ක් විසින් ලබාදී තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.3,176,850 ක් වැය කර තිබුණි. | ප්‍රතිපාදන ඌණතා පිළිබඳ අදාල අමාත්‍යාංශ දැනුවත් කර ඇත. | ලබාදුන් ප්‍රතිපාදන සීමාව මත වියදම් කළ යුතු වීම. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිශ්චිත කාලසීමාවන් තුළ විගණකාධිපතිගේ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදයේ දැක්වෙන විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. | විගණන විමසුම් වලට අදාල නිෂ්චිත කාලසීමාවන් තුල පිළිතුරු සැපයිය යුතු වීම. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ** | | | |
| (අ) 128(1) (ඒ) | අම්බලන්තොට, ලුණුගම්වෙහෙර, තිස්සමහාරාම සහ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන සැලසුම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ගණන්දීමේ නිලධාරීන් විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංක භාවය යන | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන ලෙසත් අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත්භාවය හා අවංක භාවය යන කරුණු කෙරෙහි සැලකිලිමත්ව කටයුතු කරන ලෙසත් උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 128 (1) ඒ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කරුණු මත එම කටයුතු සිදුකළ යුතු වුවද එම වගකීම ඉටුකර නොතිබුණි. | | |
| (ආ) 702(3) | කර්මාන්තවලට අදාල ගිවිසුම් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සූරිය වැව, හම්බන්තොට හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ් අනුව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස සියලු නිලධාරීන්ට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 702 (3) ඒ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.6** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීම හා පියවීම**

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් රු.141,260 ක ණය ශේෂයක් අයකල යුතුව තිබුණි. | රු.141,260 ක ණය ශේෂය පමණක් නිරවුල් වී නැත. | කල් පසු වූ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වැඩ තහනම් කර තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂ 04 කට වැඩි කාලසීමාවක් ඉක්මවා ඇති රු.443,538 ක අක්‍රීය ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රු.135,472 ක ණය ශේෂය සඳහා අදාල ලිපිගොනු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇති බවත් රු.308,066 ක ණය ශේෂ අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බවත් ඉතිරි ණය ශේෂය රු.8,000 ක වාරික මගින් අය කරනු ලබන බව. | රජයට අයවිය යුතු ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 03 දෙනෙකුගෙන් එකතුව රු.314,515 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි. මෙම ණය ශේෂ ණයකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ නොහැකි නම් ඒවා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර ඇති බව. | රජයට අයවිය යුතු ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.7 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පතු ගිණුම් අංක 6000-0-0-16-0-43 යටතේ ලබාගත් එකතුව රු.794,692 ක රැඳවුම් මුදල් තැන්පතු 09 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක් ඉක්මවා ගොස් තිබුණද අදාල තැන්පතුකරුවන්ට ගෙවීමට හෝ මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කිරීමට කටයුතු කර නොතිබුණි. | රු.170,644 ක් නිරවුල් කර ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කර්මාන්ත සඳහා ඇස්තමේන්තු සැකසීමේ දී අනුමත ගෙවීම් අනුපාතයන් යොදා ගෙන නොතිබුණු බැවින් සපිරිගම ප්‍රජා පාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.191,742 ක්, පොලියර් වත්ත සතිපොල සැකසීමේ කර්මාන්තයට අදාලව රු.128,310 ක්, ලුණුගම්වෙහෙර සතිපොල සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාලව රු.193,930 ක් සහ කාවන්තිස්ස තුරු සෙවන භූමියේ සතිපොල ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව රු.143,053 ක් වශයෙන් එකතුව රු.657,035 ක් වැඩියෙන් ඇස්තමේන්තු කර තිබුණි. | වැඩිපුර ගෙවා ඇත්නම් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන අතර ඉදිරියේ දී දිස්ත්‍රික් ඉංජිනේරුගේ උපදෙස් අනුව කටයුතු කෙරේ. පොලියර් වත්ත සතිපොල භූමිය සැකසීමේ කර්මාන්තයට අදාලව ගොඩනැගිලි මිලගණන් යොදා ගෙන ඇත. ලුණුගම්වෙහෙර සතිපොල සංවර්ධන කර්මාන්තයට අදාලව ප්‍රාදේශීය සභාවෙන් පිළිතුරු ලබා ගෙන ඉදිරියේ දී කටයුතු කරමි. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 50(II) ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | කාවන්තිස්ස තුරු සෙවන භූමියේ සතිපොල ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව රු.143,055 ක් අඩුකර ඇත. | |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් ඉටු කර තිබුණු කර්මාන්ත 07 කට අදාල ඇස්තමේන්තු සැකසීමේ දී නිවැරදි ගෙවීම් අනුපාතයන් යොදා ගෙන නොතිබීම නිසා එකතුව රු.842,872 ක් වැඩියෙන් ඇස්තමේන්තු කර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. ඉදිරියේ දී මෙම විචලනයන් අවම වන පරිදි ඇස්තමේන්තු සැකසීමට තාක්ෂණ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. තවද, දිස්ත්‍රික් ඉංජිනේරු මඟින් උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු කරමි. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 50(II) ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ඇ) | සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශයේ අලිඔලුආර කෘෂි ඇල මාර්ගයට පැති බැම්ම සකස් කිරීමමේ දී බිල්පතේ අයිතම අංක 02 හි පස් කපා පැටවීම සිදුකර නොතිබුණද රු.66,400 ක් ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී මෙම විචල්‍යතාවයන් අවම වන පරිදි ඇස්තමේන්තු සකස් කිරීම සිදු කරන ලෙස තාක්ෂණ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 50(II) ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කළයුතු වීම. |
| (ඈ) | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පහේ ගෙදර අසල සිට සිංහල ගෙදර දක්වා මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම හා කැටගල් ඇතිරීම ව්‍යාපෘතියෙහි පරීක්ෂාවට භාජනය කල කැටගල් වලින් සියයට 50 ක්ම අපේක්ෂිත සම්පිණ්ඩතා ශක්ති මට්ටමට වඩා අඩු මට්ටමක පැවතුණි. | පාඨාංකයන්හි සාමාන්‍ය අගය ගණනය කර 30NMM$^{-2}$ ට වැඩි නිසා ඒ අනුව ගෙවීම් කටයුතු සිදු කර ඇති බව. | අපේක්ෂිත සම්පිණ්ඩතා ශක්තිය තිබිය යුතු පරිදි කාර්යයන් ඉටුකළ යුතු වීම. |
| (ඉ) | ථෙරපුත්තාභයගම ශ්‍රී රාගල්ගම, සියල්සෙත්ගම යන ගම්මාන සම්බන්ධ වන අභ්‍යන්තර මාර්ග බොරළු දමා සංවර්ධනය කිරීමේ දී බොරළු ඝන මීටර 96.2 ක් අඩුවෙන් යොදා තිබූ බැවින් රු.117,874 ක් වැඩියෙන් ගෙවීමට නිර්දේශ කර තිබුණි. | දිස්ත්‍රික් ඉංජිනේරු මගින් උපදෙස් ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව. | නිවැරදි මිනුම් ලබාගෙන ගෙවීම් කටයුතු සිදුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කිරින්දාගම ප්‍රාථමික විද්‍යාලයේ ගොඩනැගිලි හා ක්‍රීඩාපිටිය වටා වැට සැකසීමේ දී කාර්මික නිලධාරී විසින් විශේෂ රේටයක් (SSR) සකස් කර තිබුණද එය ඉංජිනේරු මගින් අනුමත කර නොතිබු අතර මළ නොබැඳෙන තීන්ත ආලේප නොකර තිබිය දී ඒ වෙනුවෙන් රු.84,366 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | විශේෂ රේටයන් සකස් කිරීමේදී (SSR) මිල ගණන් ලබාගෙන ඇස්තමේන්තු සකස් කරන ලෙස තාක්ෂණ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව, දිස්ත්‍රික් ඉංජිනේරු උපදෙස් අනුව පැස්සුම් කරන ලද ස්ථානයේ පමණක් මල නිවාරණ තීන්ත ආලේප කිරීම හා එනමල් තීන්ත දෙවරක් ආලේප කිරීම සිදුකර ඇත. රේටයෙන් අඩු කිරීම්ද සිදුකර බිල්පත් ගෙවා ඇත. | විශේෂ රේට සඳහා අනුමැතිය ලබාගැනීමෙන් පසු ඇස්තමේන්තු සකස් කළ යුතු අතර ඉටුකරන ලද වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කල යුතු වීම. |

**3.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළයුතු වුවද හම්බන්තොටට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2020 වර්ෂයට අදාළව වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණන දිනය වූ 2021 මාර්තු 23 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2021.02.11 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ 2021 මැයි මස 01 දිනට පෙර ඉදිරිපත් කළ යුතු බව. | 2018 අංක 19 දරන ජාතික විගණනතේ 16(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.3 පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------------------- | ------------ |
| (අ) <u>පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශ</u><br>1987 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුව තිබුණු සිද්ධි 32 කට අදාලව එකතුව රු.8,611,826 ක හානි හා පාඩු, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (ආ) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සටහන I යටතේ 252-9828 කැබ් රථයේ අනතුරට අදාලව අයකර නොගත් අලාභයේ වටිනාකම රු.70,300 ක් වැඩියෙන් ඉදිරිපත් කර තිබුණි. | සිදුවූ මගහැරීමක් හේතුවෙන් ගිණුම සැකසීමේදී මුලු වටිනාකම වන රු.91,000 ක මුදල ඇතුලත් කර ඇති බව. | නිවැරදිව වාර්තා කළ යුතු වේ. |
| (ඇ) 1987 වර්ෂයේ භාණ්ඩ වලට සිදුවී තිබුණු රු.10,000 ක් වූ හානිවල වටිනාකම 2020 ජනවාරි 20 දින පොත් වලින් කපා හැරීම කර තිබුණද, එකී වටිනාකම පොත් වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය සටහන් II යටතේ ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) 1987 සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුව තිබුණු සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 02 ත් වර්ෂ 33 ත් අතර කාලසීමාවක් ගතව තිබුණු රු.25,000 ට අඩු වටිනාකමින් යුතු සිදුවීම් 09 කට අදාලව එකතුව රු.73,253 ක හානි හා පාඩු සම්බන්ධ ලිපිගොනුවල කටයුතු අවසන් කර නොතිබුණි. තවද, 1987 සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුව තිබුණු රු.25,000 ට වැඩි වටිනාකමින් යුතු සිදුවීම් 23 කට අදාලව එකතුව රු.8,538,572 ක වටිනාකමින් යුතු හානි හා පාඩු සම්බන්ධව ලිපිගොනුවල කටයුතු අවසන් කර නොතිබුණි. | විශේෂ කමිටුවක් පත්කර අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2019 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද රු.3,500,000 ක ගනුදෙනු ඇතුළත් විගණන විමසුමකට අදාලව 2020 දෙසැම්බර් 31 දින වන විටත් පිළිතුරු ලැබී නොතිබුණි. | 2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් මෙම ඡේද සඳහා පිළිතුරු ලබා දී ඇති අතර ඉදිරියේදී සවිස්තරාත්ම පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | නිශ්චිත කාලපරිච්ඡේය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදිය යුතු වේ. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සිරිබෝපුර නව පරිපාලන සංකීර්ණයට යාබද නිලධාරීන්ගේ නිවාස සංකීර්ණයේ ජල බිල්පත් ගෙවීම වෙනුවෙන් 2013 වර්ෂයේ සිට ප්‍රතිපූර්ණය කරගත යුතු රු.2,578,309 ක් අයකරගෙන නොතිබුණි. | අදාල නිල නිවාසවල පදිංචි නිලධාරීන් වෙත ජල ගාස්තු ගෙවන ලෙස ලිඛිතද දැනුම් දී ඇති බවත් ඒ අනුව ඉදිරියේදී ජල ගාස්තු අය කර විගණනයට වාර්තා කරන බව. | නියමිත පරිදි ප්‍රතිපූර්ණය කරගත යුතු වේ. |
| (ආ) 2020 ඔක්තෝබර් මස පරිඝණක ගත විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත සමුදායට අනුව අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමික නිලධාරී 7 ක් හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් නිලධාරියෙකු සඳහා ජාතික හැඳුනුම්පත් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. | හැඳුනුම්පත් අස්ථාන ගතවී ඇති බවත් රෝගාතුරව සිටින බැවින් ඡායාරූප ගැනීමේ අපහසුව නිසා නව හැඳුනුම්පතක් සෑදීමට නොහැකි වී ඇති බව. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) 2008 ඔක්තෝබර් 03 දිනැති 09/2008 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය, 2010 මාර්තු 30 දිනැති අංක 9/2008 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය (සංශෝධන), 2018 ජූලි 17 දිනැති අංක9/2008 (සංශෝධන ii) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ හි ඡේද අංක 3(ii) හා 2019 මැයි 09 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 06/2019 අනුව හමුදා සේවා සහ දුබලතා විශ්‍රාම වැටුප් ඒකාබද්ධ කර ගෙවිය යුතු වේ. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක | වැඩිපුර ගෙවූ මුදල 2021 පෙබරවාරි මස සිට අයකර ගැනීමට කටයුතු කරඇති බව. | -එම- |

| | | |
|---|---|---|
| 9/2008 (සංශෝධන ii) හි 3 ii ඡේදය ප්‍රකාරව පරිවර්තනය කළ පසු දුබලතාවය සඳහා ගෙවිය යුතු මුදල රු.4,404.97 ක් විය යුතු වුවද ඉහත කරුණු දෙක කෙරෙහි අවධානය යොමු නොකර අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 06 ක් හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 09 ක් සඳහා ගෙවීම් සිදුකර තිබුණි. | | |
| (ඈ) 2011 මැයි 16 දිනැති අංක 04/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ හි 03 ඡේදය හා 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙහි 03 ඡේදය ප්‍රකාරව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා විට ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් අයවැය යෝජනා අනුව හිමි විශේෂ දීමනාව ලබාදිය යුතු වුවද විශ්‍රාම වැටුප් ගෙවීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් මෙම චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බැවින් රු.782,000 ක් වැඩියෙන් ගෙවීමට සිදුව තිබුණි. | මෙම දීමනාව ගෙවීම නතර කර, මෙතෙක් වැඩිපුර ගෙවූ මුදල 2021 පෙබරවාරි මස සිට අය කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) 2012 ඔක්තෝබර් 25 දින රජයේ ගිණුම් පිළිබඳව කාරක සභාවේ 16 වන තීරණය මඟින් "නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2012 ඔක්තෝබර් 12 දක්වා දිස්ත්‍රික් ලේකම් වෙත භාර නොදී දිස්ත්‍රික් ලේකම්ට අයත් ඉඩමෙහි ඉදිකර තිබුණු රජයේ නිලධාරීන් සඳහා වන නිල නිවාස 22 අත්පත් කර ගත යුතුවේ. එසේ අත්පත් කර ගැනීමෙන් අනතුරුව ඉහත නියෝග දිනයේ සිට මාස දෙකක් තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට වාර්තා කිරීම සඳහා" නියෝග කර තිබුණද එම නියෝගය ක්‍රියාත්මක වූ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. ඉහත නිවාස සහිත භූමිය මහවැලි සංවර්ධන අධිකාරියෙන් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීම සඳහා කටයුතු කරන බව නිරීක්ෂණය වී ඇත. | අවස්ථා කිහිපයකදීම නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දීම් සිදු කරන ලද අතර මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාර ලැබී නොමැති බව. | 2012 ඔක්තෝබර් 25 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 16 වන තීරණය අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම<br>------------------------------------------------- | | |
| අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය මිනින්දෝරු අධිකාරීගේ 2010 නොවැම්බර් 29 දිනැති ලිපිය මගින් සියාරපිටිය ග්‍රාම නිලධාරී වසමේ ගම්මන්වෙල මාර්ගයේ පිහිටා ඇති රජය සතු ඉඩමෙන් රූඩ් 02 ක් සුසාන භූමියක් සඳහාද රූඩ් 01 ක් බෝධිය සඳහාද වෙන්කර තිබුණි. මෙම | විහාරාධිපති හිමියන් විසින් මෙහි ඉදිකිරීම් තවදුරටත් සිදු කරන බැවින් ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ඉඩම් පනත යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| සුසාන භූමිය සඳහා වෙන්කර තිබුණු ඉඩමේ ඊට යාබදව ඇති පන්සලේ දායක සභාව විසින් අනවසර ඉදිකිරීම් සිදුකරන බව ග්‍රාම නිලධාරී සහ ප්‍රදේශවාසීන් විසින් අවස්ථා කිහිපයකදී ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කර තිබුණද විගණිත දින වූ 2021 පෙබරවාරි 19 දින වන විටත් මෙම සුසාන භූමියේ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉඩම් පනත යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (උ) චක්‍රීය ණය වැඩසටහන<br>-------------------------- | | |
| ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු රු.200,000 ක මූලික ප්‍රතිපාදන මත කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කාන්තා සමිතිවල සාමාජිකාවන් වෙත රු.5,000, රු.10,000 හා රු.15,000 ක් බැගින් ස්වයං රැකියා සඳහා ණය ලබාදීම සිදුකර තිබුණු අතර, ණය වාරික මාස 10 කදී සියයට 6 ක පොලියක් සමඟ අයකර ගැනීමටත් ගිවිසුම් ගතව තිබුණි. මේ යටතේ ණයලාභීන් 39 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු රු.195,000 ක ණය මුදල් ගිවිසුමේ පරිදි මාස 10 කදී ගෙවා නොතිබුණු බැවින් විගණිත දිනය වූ 2021 පෙබරවාරි 19 දින වන විට රු 109,190 ක හිඟ ණය ශේෂයක් පැවතුණි. තවද, ගිවිසුමේ පරිදි සියයට 6 ක පොළියක් අයකරගත යුතු වුවද එවැනි නිශ්චිත පදනමක් නොමැතිව පොළී අයකර තිබුණු අතර, පොළී අයකිරීමේදී වාරික නොගෙවූ මාස සඳහා සමුච්චිත පොළී අයකිරීමත් සිදුකර නොතිබුණි. | හිඟ හිටි ණය ආපසු ගෙවන ලෙසට ණයලාභීන් දැනුවත් කර ඇත. පසුගිය පොලිය අය කර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලැබී නැති අතර එය බල මණ්ඩලය මගින් ගනු ලබන එකඟතාවයකි. ප්‍රාදේශීය බල මණ්ඩලය හරහා එම එකඟතාවය ලබා ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | අදාල ණය මුදල් හා පොලී නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඌ) වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මැදමූලන සමෘද්ධි බැංකු සංගමය මගින් කොවිඩ් 19 වසංගත තත්ත්ව සමයේ සහන අරුණළු ණය වැඩසටහන යටතේ සමෘද්ධි නොවන ප්‍රතිලාභීන් 23 කට ලබාදුන් එකතුව රු.115,000 ක් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමෘද්ධි සහනාධාරය නොලබන ප්‍රජා මූල සාමාජිකයන් සඳහා සමෘද්ධි අරුණළු ණය වැඩසටහන යටතේ ණය ලබා දිය හැකි බැවින්, එසේ ප්‍රතිලාභීන් 23 දෙනෙකුට ණය ලබා දී ඇති බව සහ ඒවා අය කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව. | නියමිත පරිදි ණය වාරික අයකල යුතු වීම. |

## 3.6 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 702 (3) ප්‍රකාරව කර්මාන්ත වලට අදාල ගිවිසුම් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද සූරියවැව, හම්බන්තොට හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස සියළු නිලධාරීන්ට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 702 (3) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 136 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. අතිරික්ත කාර්ය මණ්ඩලය 33 දෙනෙකු සම්බන්ධයෙන්ද අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පුරප්පාඩු හා අතිරික්තතාවයන් අමාත්‍යාංශයට වාර්තා කර ඇති අතර පුරප්පාඩු පිරවීම හා අතිරික්තතාවයන් පිළිබඳ කටයුතු කිරීම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන බව. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු කාර්ය මණ්ඩලය බඳවා ගැනීමටත් අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |